# කොළඹ මහා නගර සභාව

## මහජන ආධාර දෙපාර්තමේන්තුව

# කොළඹ මහා නගර සභාව වෙත වෘත්තීය පුහුණු උපදේශක (බාහිර) තනතුර සඳහා අයදුම්පත් කැඳවීම-2027

01. තනතුර - වෘත්තීය පුහුණු උපදේශක (බාහිර) තනතුර

පහත පාඨමාලා සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

1. තොරතුරු සන්නිවේදන තාක්ෂණ ශිල්පී පාඨමාලාව (NVQ 4) - 01
2. පෙර පාසල් ගුරු පුහුණු පාඨමාලාව (NVQ 4) - 01
3. බේකරි හා පේස්ට්‍රි පාඨමාලාව (NVQ 4) - 01
4. මැහුම් පාඨමාලාව (NVQ 3) - 06
5. අත්කම් නිර්මාණ ශිල්පී පාඨමාලාව - 01
6. වායුසමීකරණ හා ශීතකරණ පාඨමාලාව - 01
7. පැස්සුම් ශිල්පී පාඨමාලාව - 01
8. විදුලි කාර්මික ශිල්පී පාඨමාලාව - 01
9. වැඩිහිටි රැකවරණ පාඨමාලාව - 01

02. දීමනාව - දිනකට රුපියල් 3,800/- ක දීමනාවක් ලබාදෙනු ලැබේ. (දිනකට පැය 07)

03. කායික සුදුසුකම් -
i) තනතුරේ රාජකාරි ඉටු කිරීම සඳහා කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත වීම.
ii) මනා පෞරුෂත්වයකින් යුක්ත වීම.
iii) ඉගැන්වීමෙහි හැකියාව තිබීම.

04. වයස - අයදුම්පත් භාර ගන්නා දිනට වයස අවු.21ත් 65 ත් අතර විය යුතු ය.

05. අධ්‍යාපන සුදුසුකම් - සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සමාර්ථයක් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යාපන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සමත්ව තිබීම

සහ

අධ්‍යාපන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුනක් (03) සඳහා සාමාන්‍ය සාමාර්ථ තුනක් සහිතව (03) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

06. වෘත්තීය සුදුසුකම් -
i) රජයේ පිළිගත් ආයතනයක එක් එක් පාඨමාලාවට අදාළව NVQ Level 4 හෝ 5 හෝ ඊට සමාන හෝ ඊට ඉහළ මට්ටමක ඩිප්ලෝමා සහතික පත්‍රයක් හෝ සුදුසුකම් හෝ සපුරා තිබීම.
ii) අදාල කාලසීමාව තුළදී පාඨමාලාවට අදාළ විෂය නිර්දේශය ආවරණය කිරීමට හැකි වීම.

07. පළපුරුද්ද - වසර 02 කට නොඅඩු සේවා පළපුරුද්දක් සහිත වීම.

08. වෙනත් සුදුසුකම් -
i) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
ii) යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.
iii) අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට මෙම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

09. තෝරා ගැනීමේ ක්‍රමය - සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගනු ලබන අතර, විෂයට අදාළව කෙටි ඉදිරිපත් කිරීමක් සිදු කළ යුතුය.

10. ගිවිසුම් ගතවීම - පාඨමාලා කාලසීමාවන් වෙනස් වන අතර එක් එක් කාල සීමාවන්ට අදාලව කොළඹ මහා නගර සභාව සමග ගිවිසුම්ගත විය යුතුය.

- මේ සමඟ අමුණා ඇති ආදර්ශ අයදුම්පත ප්‍රකාරව සකස් කරන ලද අයදුම්පත් සම්පූර්ණ කර ඉදිරිපත් කළයුතු අතර, අයදුම්පත බහාලන කවරයෙහි වම්පස ඉහළ කෙළවරෙහි "වෘත්තීය පුහුණු උපදේශක (බාහිර )" ලෙස සඳහන් කර 2026.10.26 දිනට ප්‍රථම නාගරික කොමසාරිස්, කොළඹ මහා නගර සභාව , පුරහල , කොළඹ 07. යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.
- සේවයේ යොදවා ගැනීම සම්බන්ධයෙන් අවසන් තීරණය නාගරික කොමසාරිස් සතු වේ.

2026.10.08 දින

**ඒ.ඩී.එස්.රෝහණ**
**නාගරික කොමසාරිස්**

**කොළඹ මහා නගර සභාව**
**පුරහල, කොළඹ 07.**

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED